ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජයේ ගැසට් පත්‍රය

**2017 පෙබරවාරි මස 09 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2017.02.13 දින නිකුත් කරන ලදී)**

# සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 23.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ "අධිකරණ විශේෂඥයා", "පළාත් පාලන ආයතනය", "පළාත් සභාව", "රාජ්‍ය සංස්ථාව" හා "රජයේ කාර්යාලය" යන යෙදුම් සඳහා අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට "ලියාපදිංචි නීතිඥවරයකු පත්කිරීම" පිළිබඳ 27 වන අලුත් වගන්තියක් ප්‍රතියෝජනය කරනු ලැබේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත මෙම වගන්තියේ නීතිය බලපෑම වනුයේ 27 වන වගන්තිය යටතේ ලේඛන ගත නීතිඥවරයකු පත්කර ඇති පාර්ශ්වයක් සඳහා සහ 393 වන වගන්තිය යටතේ පත්කර ඇති නාමිකයකු සඳහා යම් කැඳවීම් නියෝගයක්, සිතාසි හෝ වෙනත් ලේඛනයක් භාරදීමට අදාළ (2) සහ (3) වන අලුත් උපවගන්ති ඇතුළත් කිරීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ X පරිච්ඡේදයට ඉක්බිතිව ම "පූර්ව නඩු විභාග දින නියම කිරීම" යනුවෙන් ශීර්ෂ දරන Xඅ අලුත් පරිච්ඡේදයක් ඇතුළත් කරනු ලබයි.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට "නඩු විභාග දින නියම කිරීම" පිළිබඳ අලුත් වගන්තියක් ප්‍රතියෝජනය කරනු ලැබේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 80අ අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එවැනි පියවර සඳහා අවසර ලබා නොදුනහොත් බරපතළ සහ අප්‍රතිකාරී අසාධාරණයක් සිදු විය හැකි බවට අධිකරණය විසින් සෑහීමට පත් වේ නම් මිස, පූර්ව නඩු විභාග පියවර සඳහා වූ කිසිදු ඉල්ලීමක් සඳහා අවස්ථාව ලබා නොදීම වේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 5 වන වගන්තිය සහ 10 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 5 වන වගන්තිය සහ 10 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ XVII පරිච්ඡේදයට ඉක්බිතිව ම "පූර්ව නඩු විභාගය" යනුවෙන් ශීර්ෂ දරනු ලබන අලුත් XVIIඅ පරිච්ඡේදයක් ඇතුළත් කරනු ලබයි.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 146 සහ 147 වන වගන්ති ඉවත් කරනු ලබයි.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් නඩු ඒකාබද්ධ කිරීමට අදාළ 149අ අලුත් වගන්තියක් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළු කරනු ලබයි.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 151අ අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් සාක්ෂියකට ප්‍රධාන වශයෙන් වූ, වාචික පරීක්ෂණයක් සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු බවට අධිකරණය විසින් නියෝගයක් නිකුත් කිරීම වේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 393 සිට 398 දක්වා (එම වගන්ති දෙකම ඇතුළුව) වගන්ති ඉවත් කර ප්‍රතියෝජනය කරනු ලැබේ.

***15 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 405 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලැබේ.

***16 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් පිළිවෙළින් "යම් රජයේ කාර්යාලයක්, සංස්ථාවක් ආදිය විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛනවල පිටපත් ලබා ගැනීම " සහ "අභියෝගයට භාජනය කරනු ඇත්නම් මිස අත්‍යවශ්‍ය ලේඛන පිළිබඳ සාක්ෂි" පිළිබඳව ප්‍රධාන ප්‍රඥප්තියේ 440ආ සහ 440ඇ අලුත් වගන්ති ඇතුළත් කරනු ලැබේ.

***17 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 774 වන වගන්තියට අලුත් (3) වන උපවගන්තියක් ඇතුළත් කරනු ලැබේ.

***18 වන වගන්තිය :*** මේ වගන්තියේ නීතිය බලපෑම වනුයේ දිසා අධිකරණයේ ගොනුකර ඇති, එහෙත් නඩු විභාගය සඳහා කිසිදු දිනයක් නියමකර නොමැති සියලු නඩු සහ කාරණා මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට බලපැවැත්වෙන පරිදි මේ පනතේ විධිවිධානවලට යටත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***19 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් "7අ" අලුත් ආකෘතියක් ඇතුළත් කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

එල්. ඩී.— ඕ. 48/2015.

## (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2017 අංක  දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 101 වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "අධිකරණය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීම මගින්:-

""අධිකරණ විශේෂඥයා'' යන්නෙන්, යම් විෂයයක්, ක්ෂේත්‍රයක් හෝ ශිල්පයක විශේෂ නිපුණතාවයක් හෝ දැනුමක් සහිත පුද්ගලයකු අදහස් විය යුතු ය.";

(2) "නෛතික ලේඛනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

""පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවන් යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියකින් හෝ නීතියක් යටතේ පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ,";

(3) "මුල් අධිකරණය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""පළාත් සභාව" යන්නෙන්, 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

2—PL 004961—475 (2017/01)

154අ ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ පළාත් සභාවක් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, ප්‍රදානයක්, ණය මුදලක් හෝ අන්‍යාකාරයක් මගින් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ ලබා දෙන ලද අරමුදල් හෝ ප්‍රාග්ධනය සහිතව, 2007 අංක 7 දරන සමාගම් පනත හැර වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලබන යම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"රජයේ කාර්යාලය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනතේ අර්ථ නිරූපණය මගින් දක්වා ඇති අර්ථය ම අදහස් විය යුතු ය;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ලේඛනගත නීතිඥවරයකු පත් කිරීම.

27. (1) ඉහත කී පරිදි යම් පෙනී සිටීමක් සඳහා හෝ ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා හෝ යම් ක්‍රියාවක් කිරීම සඳහා ලේඛනගත නීතිඥවරයකු පත් කිරීම:-

(අ) මේ පනතේ පළමුවන උපලේඛනයේ අංක 7 දරන ආකෘතියෙහි නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු ය;

(ආ) ලේඛනගත නීතිඥවරයා පෙනී සිටින පාර්ශ්වය වෙනුවට එම ලේඛනගත නීතිඥවරයා වෙත මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් කැඳවීම් නියෝගයක් භාරදිය හැකි ලිපිනයක් එම පත්වීමෙහි අන්තර්ගත විය යුතු ය;

(ඇ) යම් කැඳවීම් නියෝගයක්, දැන්වීමක් හෝ වෙනත් අදාළ තොරතුරක් ලේඛනගත නීතිඥවරයා වෙත භාරදිය හැකි විද්‍යුත් තැපැල් ලිපිනයක් ඇත්නම්, එම ලිපිනය එම පත් කිරීමට ඇතුළත් කළ යුතු ය.

(2) (අ) ලේඛනගත නීතිඥවරයකු පත් කරන පාර්ශ්වයක් ස්වභාවික තැනැත්තකු වන අවස්ථාවක, යම් නීති කෘත්‍යයක අවසාන තීරණයට එළඹීමට පෙර එම පාර්ශ්වය මියගියහොත් එම නීති කෘත්‍යයේ කාර්ය සඳහා නීත්‍යනුකූල නියෝජිතයකු නම් කරමින් ලේඛනයක් ද ඉදිරිපත් කළ යුතු ය;

(ආ) ඉහත සඳහන් ලේඛනය මෙහි පළමුවන උපලේඛනයේ අංක 7අ දරන ආකෘති පත්‍රයේ නිශ්චිතව දැක්වෙන ආකෘතියට සාරානුකූල විය යුතු ය;

(ඇ) එම නීත්‍යනුකූල නියෝජිතයා නම් කිරීම සහ එම ලේඛනය ගොනු කිරීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 393 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ පත්වීම ගොනු කරනු ලැබූ විට-

(අ) අධිකරණයේ අවසරය ඇතිව සහ සේවාදායකයා විසින් අත්සන් කරනු ලැබ, අධිකරණය වෙත ගොනු කරනු ලබන ලියවිල්ලක් මගින් ලේඛනගත නීතිඥවරයාට දැනුම්දීමෙන් පසු ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තුරු;

(ආ) (i) සේවාදායකයා විසින් අත්සන් කරනු ලැබ අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලක් මගින්;

(ii) අධිකරණයේ අවසර ඇතිව සේවාදායකයාට දින තිහක දැන්වීමක් ලබා දීමෙන් පසු,

ලේඛනගත නීතිඥවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තුරු;

(ඇ) සේවාදායකයා මියයන තුරු;

(ඈ) ලේඛනගත නීතිඥවරයා මියයන තුරු හෝ ඔහුට අන්‍යාකාරයකින් ක්‍රියා කිරීමට නොහැකිවන තුරු; හෝ

(ඉ) නඩුවේ සියලු නඩු කටයුතු අවසන් කර සේවාදායකයා සම්බන්ධයෙන් නඩු තීන්දුව ඉෂ්ට කරනු ලබන තුරු; හෝ

එම පත්කිරීම බල සහිත වන්නේ ය.

(4) යම් පෙනී සිටීමක් සඳහා හෝ ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා හෝ ක්‍රියා කිරීමට තමාට බලය පවරන කිසිම ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස කිසිම නීතිඥවරයකුට නියම නොකළ යුතු ය. නීතිපතිවරයා විසින් යම් විශේෂිත නඩුවක දී විශේෂයෙන් ක්‍රියා කිරීමට හෝ රජය වෙනුවෙන් සාමාන්‍යයෙන් ක්‍රියා කිරීමට හෝ ලේඛනගත නීතිඥවරයකු පත් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තිය එහි (1) උපවගන්තිය වශයෙන් නැවත අංක යෙදීමෙන්;

(2) එහි නැවත අංක යෙදූ (1) උපවගන්තියට ඉක්බිතිව ම එම වගන්තියේ (2) උපවගන්තිය සහ (3) වන උපවගන්තිය වශයෙන් අංක යෙදිය යුතු පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීම මගින්:-

"(2) අධිකරණය විසින් අන්‍යාකාරයකට විධාන කරනු ලැබුවහොත් මිස 27 වන වගන්තියේ (1) උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ලබා දී ඇති ලිපිනයට සහ 27 වන වගන්තියේ (1) උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ලබා දී ඇති විද්‍යුත් ලිපිනයට යම් කැඳවීම් නියෝගයක්, දැන්වීමක් හෝ වෙනත් ලේඛනයක් භාර දීම, ලේඛනගත නීතිඥවරයා පත් කරනු ලැබුවේ යම් පාර්ශ්වයක් විසින් ද එම පාර්ශ්වයට ප්‍රමාණවත් ලෙස භාර දී ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(3) 27 (2) වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ලේඛනයක ලබා දී ඇති ලිපිනයට කැඳවීම් නියෝගයක්, දැන්වීමක් හෝ වෙනත් ලේඛනයක් භාරදීම, 393 වන වගන්තිය යටතේ පත් කරන ලද නාමිකයකුට හෝ නාමිකයන්ට ප්‍රමාණවත් ලෙස භාරදීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට නව Xඅ පරිච්ඡේදය ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ X පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පරිච්ඡේදයේ Xඅ පරිච්ඡේදය ලෙස බලාත්මක විය යුතු ය:-

"X අ පරිච්ඡේදය

**පූර්ව නඩු විභාග දිනය නියම කිරීම**

පූර්ව නඩු විභාගය සඳහා වූ දිනය.

79අ (1) අධිකරණය විසින් -

(අ) විත්තිකරුගේ උත්තරය ඉදිරිපත් කිරීම සඳහා අවසර දී ඇති කාලසීමාව ඉකුත් වූ වහාම; හෝ

(ආ) ප්‍රතිඋත්තරයක් ඉදිරිපත් කිරීමට අවසර දී ඇති අවස්ථාවක එම ප්‍රතිඋත්තරය ගොනු කිරීම සඳහා අවසර දී ඇති කාලසීමාවේ අවසාන දිනයේ දී; සහ

එම උත්තරය හෝ ප්‍රතිඋත්තරය ගොනු කරනු ලැබුව ද, ගොනු කරනු නොලැබුව ද, නඩුවේ සියලු පාර්ශ්වයන් ඉදිරිපිට දී හෝ පැමිණ සිටින පාර්ශ්වයන් ඉදිරිපිට දී පූර්ව නඩු විභාගය ආරම්භ කරනු ලැබීමට අපේක්ෂිත දින සිට සති තුනකට පෙර නොවන සහ මාස දෙකක් නොඉක්මවන දිනයක් නියම කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණය විසින් දිනයක් නියම කිරීමට පෙර නීති කෘත්‍ය පිළිබඳව පැමිණ නොසිටි පාර්ශ්වයන්ට යථා පරිදි දැනුම් දී ඇති බවට අධිකරණය සෑහීමට පත් විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"විභාග දිනය නියම කිරීම.

80. නඩුව විභාග වන අධිකරණයේ දී නඩුව විභාග කිරීමේ දිනය නියම කිරීම සඳහා නඩුව කැඳවීමට නියම කර ඇති දිනයේ දී, අධිකරණය විසින් නඩුව විභාග කිරීමේ දිනයක් නියම කළ යුතු අතර, 55 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි ලියාපදිංචි ලිපිනයක් සපයා ඇත්තා වූ ද, ඒ දැන්වීම භාරදීමේ වියදම ඉදිරිපත් කර ඇත්තා වූ ද, සියලු පාර්ශ්වකරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඒ පිළිබඳව ලියවිල්ලකින් දැන්වීමක් කළ යුතු ය.".

80අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 80අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"නඩු විභාග දිනය නියම කිරීමෙන් පසුව පූර්ව නඩු විභාග පියවර සඳහා වන කිසිදු ඉල්ලීමක් සඳහා අවසර නොදිය යුතු බව.

80අ. (1) (අ) පූර්ව නඩු විභාග පියවර සඳහා අවසර දෙනු නොලැබුවහොත් බරපතළ හා අප්‍රතිකාරී අසාධාරණයක් සිදුවන බවට වාර්තාගත කළ යුතු හේතු අනුව අධිකරණය සෑහීමට පත්වන්නේ නම් මිස, නඩුව විභාග කිරීම සඳහා නියම කරනු ලබන දිනයේ දී හෝ ඊට පසුව පූර්ව නඩු විභාග පියවර සඳහා කිසිදු ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට අවසර දෙනු නොලැබිය යුතු ය.

(ආ) කවර ආකාරයේ වුව ද, එවැනි ඉල්ලීමක් කරන පාර්ශ්වයකට එරෙහිව අධිකරණය විසින් ගාස්තු සම්බන්ධයෙන් වූ නියමයන් හෝ අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන වෙනත් නියමයක් පනවනු ලැබිය හැකි ය.

(2) නඩුව විභාග කරනු ලබන්නේ යම් විසඳිය යුතු ප්‍රශ්න මත ද එම විසඳිය යුතු ප්‍රශ්න පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් එකඟවන අවස්ථාවක, විශේෂ අවස්ථානුගත කරුණුවල දී හැර, සහ සංශෝධනයක් කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීම මගින් එම සංශෝධනය ඉල්ලුම් කරන පාර්ශ්වයට බරපතළ අසාධාරණයක් සිදුවන බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම් මිස, නඩු විභාගයේ දී එයට කිසිදු සංශෝධනයක් කරනු නොලැබිය යුතු ය.

(3) එකම නඩුවක දී නීතිය පිළිබඳ සහ සිද්ධීන් පිළිබඳ විසඳිය යුතු ප්‍රශ්න මතු වන අවස්ථාවක සහ නීතිය පිළිබඳව වූ විසඳිය යුතු ප්‍රශ්න මත පමණක් නඩුව විභාග කළ හැකි බව අධිකරණයේ මතය වන අවස්ථාවක, අධිකරණය විසින් එම විසඳිය යුතු ප්‍රශ්න පළමුව විභාග කළ යුතු අතර, එම කාර්යය සඳහා සුදුසු යයි හැඟෙන්නේ නම්, නීතිය පිළිබඳ වූ විසඳිය යුතු ප්‍රශ්න තීරණය කර අවසන් කරන තුරු සිද්ධිමය කරුණු පිළිබඳ විසඳිය යුතු ප්‍රශ්න විභාග කිරීම අඩාලව කල් තැබිය හැකි ය.".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තියේ "නඩුව විභාග කිරීම සඳහා පළමුවෙන් නියම කරන ලද දිනයට" යන වචන වෙනුවට "පූර්ව නඩු විභාගයට පළමුවෙන් නියම කරන ලද දිනයට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "නඩුව විභාග කිරීම සඳහා පළමුවෙන් නියම කරන ලද දිනයේ දී" යන වචන වෙනුවට "පූර්ව නඩු විභාගයට පළමුවෙන් නියම කරන ලද දිනයේ දී" යන වචන ආදේශ කිරීමෙන්.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "නඩුව ඇසීමට මත්තෙන්" යන වචන වෙනුවට "පූර්ව නඩු විභාගයට මත්තෙන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ XVII පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය XVIIඅ පරිච්ඡේදය ලෙස බලාත්මක විය යුතු ය:-

ප්‍රධාන ප්‍රඥප්තියට XVIIඅ නව පරිච්ඡේදය ඇතුළත් කිරීම.

"XVIIඅ පරිච්ඡේදය

**පූර්ව නඩු විභාගය**

පිළිගැනීම් සහ විසඳිය යුතු ප්‍රශ්න.

142අ. පූර්ව නඩු විභාගය සඳහා නියමිත දිනයට දින දාහතරකට පෙර පාර්ශ්වයන් විසින් සෙසු සියලුම පාර්ශ්වයන් වෙත පිළිගැනීම්වල සහ ඉදිරිපත් වූ

ප්‍රශ්නවල පිටපතක් ඉදිරිපත් කිරීම මගින් එම ලේඛන භාර දුන් බවට සාක්ෂි සහිතව තම යෝජිත පිළිගැනීම් සහ විසඳිය යුතු ප්‍රශ්න ලිඛිතව අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට භාර දිය යුතු ය.

පූර්ව නඩු විභාග දිනය ඉදිරියට ගැනීම හෝ කල් තැබීම.

142ආ. 142අ වගන්තියේ විධිවිධානවලට යටත්ව පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් සිය අභිමතය පරිදි හෝ යම් පාර්ශ්වයක් විසින් කරනු ලබන ඉල්ලීමක් මත සහ ප්‍රමාණවත් පරිදි හේතු දක්වා ඇති විට පූර්ව නඩු විභාගය සඳහා නියම කර ඇති දිනය ඉදිරියට ගැනීම හෝ කල් තැබීම කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් වාර්තාගත කරනු ලබන හේතු අනුව එම නඩු විභාගය ආරම්භ කළ දින සිට මාස තුනක් ඇතුළත නඩු විභාගය අවසන් කිරීමෙන් පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා වළක්වනු ලබන්නේ නම් මිස, පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් එම නඩු විභාගය ආරම්භ කළ දින සිට මාස තුනක් ඇතුළත නඩු විභාගය අවසන් කළ යුතු අතර විශේෂ අවස්ථානුගත කරුණුවල දී හැර, සති හතරකට වැඩි කාලයක් සඳහා කල් තැබීමක් ලබා නොදිය යුතු ය.

පාර්ශ්වයන් අධිකරණයට නොපැමිණි විට.

142ඇ. (1) යම් පාර්ශ්වයක් -

(අ) ඔහුගේ හෝ ඇයගේ නඩුව පිළිබඳව නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමට අසමත් වන්නේ නම්; හෝ

(ආ) පූර්ව නඩු විභාගය සඳහා නියම කළ දිනයේ දී හෝ එම පූර්ව නඩු විභාගය කල් තබනු ලැබූ වෙනත් යම් දිනයක දී අධිකරණයට පැමිණීමට අසමත් වන්නේ නම්,

පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් සියලුම උචිත අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන -

(i) මේ සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ නිශ්චිතව දැක්වෙන ක්‍රමවලින් එක ක්‍රමයක් අනුව නඩුව සම්බන්ධයෙන් සුදුස්සක් කළ හැකි ය; හෝ

(ii) එම විනිශ්චයකාරවරයා විසින් සුදුසු යයි සලකනු ලබන වෙනත් යම් නියෝගයක් කරනු ලැබිය හැකි ය.

(2) XII වන පරිච්ඡේදයේ නිශ්චිතව දැක්වෙන ක්‍රමවලින් එක් ක්‍රමයක් අනුගමනය කරමින් නඩුව සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමට පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා කටයුතු කරන අවස්ථාවක, එම නීති කෘත්‍යයට සහ ඊට අදාළව එම පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

පූර්ව නඩු විභාගය.

142ඈ. පූර්ව නඩු විභාගයේ දී පහත දැක්වෙන අරමුණු ඇතිව පාර්ශ්වයන්ගෙන් ප්‍රශ්න කිරීමට හෝ නඩුව සම්බන්ධයෙන් තමන් කියා සිටින තත්ත්වය ප්‍රකාශ කරන ලෙස එම පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටීමට පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයාට බලය ඇත්තේ ය:-

(අ) අධිකරණ බලය සම්බන්ධයෙන් වූ ප්‍රශ්න පිළිබඳව දැනගැනීම;

(ආ) ආරාවුලට තුඩු දී ඇති කරුණු පිළිබඳව දැනගැනීම;

(ඇ) සිද්ධිමය කරුණු හා ලේඛන පිළිබඳව පාර්ශ්වයන්ගේ පිළිගැනීම් ලබා ගැනීම;

(ඈ) විභාග වෙමින් පවත්නා නඩු දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් ඒකාබද්ධ කිරීම;

(ඉ) විශේෂඥ සාක්ෂිකරුවන් ඇතුළු සාක්ෂිකරුවන් ප්‍රමාණය පිළිගැනීම හා අදාළ වීම මත පදනම්ව හඳුනාගැනීම;

(ඊ) අධිකරණ විශේෂඥයකු පත්කිරීම;

(උ) එම නඩුවේ දී විසඳිය යුතු කරුණට අදාළ යම් වෙනස් කිරීමකට, සමථයට පත්කිරීමට, එකඟතාවයකට හෝ වෙනත් ගිවිසුමකට ඇතුළත් වීමට පාර්ශ්වයන්ට සහාය වීම සහ ඒ සඳහා නඩුවේ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන තම මතය අනුව සාධාරණ වන සමථ කොන්දේසි යෝජනා කිරීම;

(ඌ) නඩුව පිළිබඳව කඩිනමින් සුදුස්සක් කිරීමේ දී උපකාර විය හැකි වෙනත් යම් කරුණු දැන ගැනීම සහ වාර්තාගත කිරීම; සහ

(එ) කඩිනමින් හා අඩු වියදමින් නඩුව පිළිබඳව සුදුස්සක් කිරීම සඳහා අවශ්‍ය බවට හෝ යෝග්‍ය බවට පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයාට පෙනී යන සියලු පියවර ගැනීම හා සියලු නියෝග නිකුත් කිරීම.

පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් ආඥා කළ හැකි බව.

142ඉ. පූර්ව නඩු විභාගයේ දී, පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා වෙත 142ඇ වගන්තිය මගින් පවරා ඇති බලතල එම විනිශ්චයකාරවරයා විසින් ක්‍රියාත්මක කළ යුතු අතර-

(අ) අදාළ සිද්ධිමය කරුණු පිළිබඳව විශේෂිත හා ස්වාධීන දැනුම ඇති තැනැත්තකුගෙන් ලබා ගත් ලිඛිත වාර්තාවක් මගින් තීරණය කරනු ලබන එම සිද්ධිමය කරුණු පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන්;

(ආ) යම් සිද්ධිමය කරුණක් පිළිබඳ ප්‍රශ්නයක් මත හෝ යම් මතයක් පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා ස්වාධීන විශේෂඥයකු පත්කිරීම සඳහා වූ ආඥාවක් ඇතුළු සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIX පරිච්ඡේදය යටතේ අධිකාර පත්‍රයක් නිකුත් කිරීම සඳහා; හෝ

(ඇ) යම් රජයේ කාර්යාලයක, රාජ්‍ය සංස්ථාවක, පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක භාරයේ ඇති යම් ලේඛනයක සහතික පිටපත් නිකුත් කිරීම සඳහා වූ,

එම පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් වාර්තාගත කළ යුතු කරුණු.

142ඊ. (1) පූර්ව නඩු විභාගයේ දී පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් පහත දැක්වෙන කරුණු වාර්තාගත කළ යුතු ය:-

(අ) සිද්ධිමය කරුණු හෝ ලේඛන හෝ ලේඛනවල අන්තර්ගත කරුණු පාර්ශ්වයන් විසින් පිළිගැනීම;

(ආ) යම් කරුණක් සම්බන්ධයෙන් පාර්ශ්වයන්ගේ එකඟ වීම;

(ඇ) පහත දැක්වෙන කරුණු පිළිගෙන ඊට අනුකූලව ක්‍රියා කිරීමට පාර්ශ්වයන් එකඟ වීම:-

(i) පාර්ශ්වයන් අතර එකඟ වන ආකාරයට පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා එළඹුන යම් තීරණයක් සහ එම තීරණයට අනුකූලව නඩු තීන්දුව වාර්තාගත කිරීම;

(ii) සිද්ධිමය හෝ නීතිය පිළිබඳ යම් ප්‍රශ්නයක් හෝ සියලු ප්‍රශ්න මත පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් ගනු ලබන යම් තීරණයක් සහ එම තීරණයට අනුකූලව නඩු තීන්දුව වාර්තාගත කිරීම;

(ඈ) (i) යම් සිද්ධිමය කරුණක් හෝ ලේඛනයක් ඔප්පු කිරීමේ ක්‍රමය සම්බන්ධයෙන්;

(ii) කැඳවීමට නියමිත සාක්ෂිකරුවන්ගේ ප්‍රමාණය සම්බන්ධයෙන්;

(iii) විභාග වෙමින් පවතින නඩු දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් ඒකාබද්ධ කිරීම,

යන කරුණු සම්බන්ධයෙන් පාර්ශ්වයන් අතර ඇති යම් එකඟත්වයක්;

(ඉ) නඩු ඉල්ලා අස්කර ගැනීම; සහ

(ඊ) නඩු වෙනස් කිරීම, සමථයකට පත් කිරීම හෝ බේරුම් කිරීම.

(2) (1) උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පාර්ශ්වයන් අතර ඇති ගිවිසුමක් පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් වාර්තා කරනු ලබන අවස්ථාවක දී, එම විනිශ්චකාරවරයා විසින් අදාළ පාර්ශ්වයන්ට එම ගිවිසුම කියවා එහි බලපෑම පැහැදිලි කළ යුතු අතර, එම ගිවිසුමේ ඇතුළත් කරුණු සහ එකී බලපෑම පාර්ශ්වයන් තේරුම් ගෙන ඇති බව වාර්තාගත කළ යුතු ය. ගිවිසුම අත්සන් කරන ලෙස පාර්ශ්වයන්ට නියම කරනු ලැබිය යුතු ය.

**පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් විසඳිය යුතු ප්‍රශ්න තීරණය කළ යුතු බව.**

142උ. පූර්ව නඩු විභාගයේ දී, විසඳිය යුතු ප්‍රශ්න තීරණය කිරීමේ දී 142අ වගන්තිය යටතේ ලිඛිතව ඉදිරිපත් කර ඇති යෝජිත පිළිගැනීම් සහ විසඳිය යුතු ප්‍රශ්න, විචාරන, උත්තරවාද සහ යම් ගිවිසුමක් සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

**විසඳිය යුතු ප්‍රශ්න නැගීම පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් අඩාලව කල් තැබිය හැකි බව.**

142ඌ. අධිකරණය ඉදිරියේ නොමැති යම් තැනැත්තකුගේ සාක්ෂි නොගෙන හෝ නඩුවට ඉදිරිපත් කර නොමැති යම් ලේඛනයක් පරීක්ෂා නොකර විසඳිය යුතු ප්‍රශ්න නිවැරදි ලෙස නැගිය නොහැකි යයි පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චකාරවරයාගේ මතය වන අවස්ථාවක, විසඳිය යුතු ප්‍රශ්න නැගීමේ දිනය අධිකරණය විසින් නියම

කරනු ලබන යම් මතු දිනයකට අධිකරණය විසින් අඩාලව කල් තැබිය හැකි අතර, පැමිණ සිටින ලෙස හෝ ඒ ලේඛනය ඉදිරිපත් කරන ලෙස හෝ අධිකරණය විසින් සිතාසි මාර්ගයෙන් හෝ වෙනත් අධිකරණ නියෝගයක් මාර්ගයෙන් ඒ තැනැත්තාට බල කළ හැකි ය.

පූර්ව නඩු විභාග පියවර ගැනීමෙන් නඩු දිනය නියම කළ යුතු බව.

142එ. (1) විසඳිය යුතු ප්‍රශ්න සම්බන්ධව එකඟවීමෙන් පසු, සහ -

(අ) සියලු පූර්ව නඩු විභාග පියවර ගෙන ඇති බවට පාර්ශ්වයන් විසින් පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයාට දැනුම් දීමේ දී; සහ

(ආ) 142ඇ වගන්තියේ සඳහන් සියලු පූර්ව නඩු විභාග පියවර පාර්ශ්වයන් විසින් ගෙන ඇති බවට පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා සෑහීමට පත්වන අවස්ථාවක,

නඩුව විභාග වන අධිකරණයේ දී නඩුවේ විභාග දිනය නියම කිරීම සඳහා එම දිනයේ සිට දින දහහතරක් ඇතුළත පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් නඩුව අඬගසනු ලැබිය යුතු ය.”.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 146, 147 සහ 148 වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 146, 147 සහ 148 වගන්ති ඉවත් කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 149 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය 149අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 149අ වන වගන්තිය ඇතුළත් කිරීම.

“නඩු ඒකාබද්ධ කිරීම.

149අ. (1) නීතිය පිළිබඳ ප්‍රශ්න හෝ සිද්ධිමය කරුණු පිළිබඳ ප්‍රශ්න සාරානුකූලව එක සමාන වන නඩු දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන නියමයන් මත සහ

පාර්ශ්වයන්ගේ එකඟත්වය ඇතිව ඒකාබද්ධ කරන ලෙස අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(2) පාර්ශ්වයන්ගේ කැමැත්ත ඇතිව -

(අ) නඩු කීපයක් එකම අවස්ථාවක දී සහ එකම සාක්ෂි මත විභාග කරන ලෙස; හෝ

(ආ) එක නඩුවක සාක්ෂි තවත් නඩුවක සාක්ෂි වශයෙන් භාවිත කළ යුතු බවට; හෝ

(ඇ) නඩු කීපයකින් එක නඩුවක් විභාග කර එම නඩුවේ ප්‍රතිඵලයෙන් අනික් නඩු බැඳී සිටීම සඳහා අනෙක් නඩු නැවැත්වීමට,

අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, තෝරාගත් නඩුව අදාළ විසඳිය යුතු ප්‍රශ්න පිළිබඳ නිවැරදි නඩු විභාගයක් නොවන අවස්ථාවක, එසේ විභාගය නවත්වා ඇති නඩුවලින් වෙනත් නඩුවක් විභාග කිරීමට යම් පාර්ශ්වයක ඉල්ලීමක් මත අධිකරණයට බලය තිබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට අලුතින් 151අ වගන්තිය ඇතුළත් කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 151අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“දිවුරුම් ප්‍රකාශයක් ආදේශ කළ හැකි බව.

151අ. (1) 151 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අධිකරණය විසින් ස්වකීය මෙහෙයවීමෙන් හෝ නඩුවේ යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීමක් මත, ප්‍රධාන සාක්ෂි විභාගය වෙනුවට දිවුරුම් ප්‍රකාශයක් ආදේශ කළ යුතු බවට නියෝග කර අධිකරණය විසින් නියම කරනු ලබන දිනයක දී එම දිවුරුම් ප්‍රකාශය භාර දිය යුතු බවට සාක්ෂිකරු කැඳවන පාර්ශ්වයට විධාන කරනු ලැබිය හැකි අතර, විරුද්ධ පාර්ශ්වයට නඩු විභාගයට සූදානම් වීමට හැකි වන පරිදි එකී දිනය අවම වශයෙන් නඩු විභාග දිනයට පෙර දින දහයකට කලින් වූ දිනයක් විය යුතු ය.

(2) (1) උපවගන්තිය යටතේ අධිකරණය විසින් නියෝගයක් කරනු ලැබූ අවස්ථාවක දී එම දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ වගකීම ඇති පාර්ශ්වය විසින් එම දිවුරුම් ප්‍රකාශය සහ එහි සඳහන් ලේඛන ද එම දිවුරුම් ප්‍රකාශයේ පිටපතක් සහ සියලු ලේඛනවල පිටපත් විරුද්ධ පාර්ශ්වයන්ට භාර දුන් බවට සාක්ෂි ද අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) නඩු විභාග දිනයේ දී දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් එම දිවුරුම් ප්‍රකාශයේ ප්‍රතිඥා දී ඇති හෝ දිවුරා ඇති සාක්ෂිකරු හරහා එම දිවුරුම් ප්‍රකාශය ද එහි සඳහන් සියලු ලේඛන ද අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම සාක්ෂි හෝ එහි යම් කොටසක් ආවේශ්‍ය කළ නොහැකි බව හෝ දිවුරුම් ප්‍රකාශයට අමුණා ඇති යම් ලේඛන ආවේශ්‍ය කළ නොහැකි වීම නිසා හෝ නිවැරදි බවට සහතික කළ නොහැකි වීම නිසා එම දිවුරුම් ප්‍රකාශයට විරුද්ධ වීමට විරුද්ධ පාර්ශ්වයට හිමිකමක් ඇත. එවැනි අවස්ථාවක දී විරුද්ධ පාර්ශ්වය විසින් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට පෙර අධිකරණය විසින් එම විරෝධතාවය පිළිබඳ රීති අණක් ලබා දිය යුතු ය:

එසේ වුව ද, අධිකරණය විසින් උචිත අවස්ථාවෝචිත පරිදි දිවුරුම් ප්‍රකාශයේ අන්තර්ගත සාක්ෂිවලට අමතරව වාචික සාක්ෂි ලබා ගැනීමට අවසර දිය හැකි ය.

(4) යම් දිවුරුම් ප්‍රකාශයක ප්‍රවාදක කරුණු හෝ අපකීර්තිමත් කරුණු ඇතුළත් වේ නම් අධිකරණය විසින් එවැනි කරුණු කපා හරින ලෙස නියෝග කර දිවුරුම් ප්‍රකාශයේ අන්තර්ගත සෙසු කරුණු මත නඩුව විභාග කළ හැකි ය; නැතහොත් ආවේශ්‍ය කළ හැකි නව දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස එම දිවුරුම් ප්‍රකාශය ගොනු කළ පාර්ශ්වයට නියම කරනු ලැබිය යුතු අතර, නඩු ගාස්තු ගෙවීමට ද එම පාර්ශ්වය යටත් වන්නේ ය.”.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 393 සිට 398 දක්වා (එම වගන්ති දෙක ද ඇතුළුව) වූ වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 393 සිට 398 දක්වා වූ වගන්ති ප්‍රතියෝජනය කිරීම.

"ලේඛනය.

393. (1) (මෙහි මින්මතු "නම්කළ පාර්ශ්වය" යනුවෙන් සඳහන් කරනු ලබන) 27(2) වන වගන්තිය යටතේ ලේඛනගත නීතිඥවරයකු පත්කරන යම් පාර්ශ්වකරුවකු විසින්, මේ නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට තිබිය දී එම පාර්ශ්වකරු මිය ගියහොත්, නඩුවේ කාර්ය සඳහා, තමාගේ නීත්‍යානුකූල නියෝජිතයා ලෙස කටයුතු කිරීමට, ප්‍රමුඛත්වය අනුව අවම වශයෙන් එක් තැනැත්තෙක් සහ තිදෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක් නම්කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර කවර හෝ අවස්ථාවක දී ලේඛනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, අධිකරණය විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ යම් පාර්ශ්වයක් විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින්, තත්කාර්ය සඳහා නියම කරනු ලබන දිනයක දී හෝ එදිනට පෙර එවැනි ලේඛනයක් ගොනු කරන ලෙස අධිකරණය විසින් නඩුවේ යම් පාර්ශ්වකරුවකුට හෝ මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ ලේඛනයක් ගොනු කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය. එවැනි ලේඛනයක් ගොනු කිරීම පැහැර හරින අවස්ථාවක, අධිකරණය විසින් ගෙවීම පැහැර හරින පාර්ශ්වය මත උචිත දණ්ඩනයක් පනවනු ලැබිය හැකි ය.

(2) (අ) නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට පෙර නම්කළ තැනැත්තා මිය ගිය අවස්ථාවක, අදාළ ලේඛනයේ තමාගේ නම යොදා ඇති ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව (1) වන උපවගන්තිය යටතේ නම් කරනු ලැබූ තැනැත්තා මේ නඩුවේ කාර්ය සඳහා පාර්ශ්වකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) ලේඛනයේ නම සඳහන් නීත්‍යනුකූල නියෝජිතයා මියගියහොත් හෝ අබලතාවයකට පත් වුවහොත් නඩුවේ කාර්ය සඳහා ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව ඊළඟට නම්කර ඇති තැනැත්තා නීත්‍යනුකූල නියෝජිතයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) නීත්‍යනුකූල නියෝජිතයා ලෙස නම් කරනු ලබන තැනැත්තා එසේ පත් කිරීම සඳහා තම කැමැත්ත දක්වමින් එම ලේඛනයට ඔහුගේ හෝ ඇයගේ අත්සන යෙදිය යුතු ය. නම යෝජනා කරන තැනැත්තාගේ අත්සන සහ පත් කිරීමට කැමැත්ත පළකර ඇති නාමිකයා හෝ නාමිකයන්ගේ අත්සන් නීතිඥවරයකු විසින් හෝ සාමදාන විනිශ්චයකාරවරයකු විසින් හෝ දිවුරුම් කොමසාරිස්වරයකු විසින් සාක්ෂි දැරිය යුතු ය.

(3) නාමිකයකු විසින් කවර හෝ අවස්ථාවක දී නම්කළ පාර්ශ්වයට දැන්වීම් සහිතව එසේ නාමිකයකු වශයෙන් ලබා දී ඇති කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමට මෝසමක් මගින් අධිකරණයට ඉල්ලුම් කළ හැකි අතර, එවැනි අවස්ථාවක දී ඔහු නම්කළ තැනැත්තාගේ නාමිකයා වීම අවසන් වී ඇති බවට අධිකරණය විසින් ආඥා කර එම නාමිකයාගේ නම ඉවත් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(4) මේ වගන්තියේ (1) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව නඩුව අවසාන වශයෙන් තීරණය කිරීමට හෝ නම්කරන පාර්ශ්වය විසින් කවර හෝ අවස්ථාවක දී නාමිකයන් එක් අයෙකු හෝ වැඩි ප්‍රමාණයක් නම්කරමින් එවකට සිටි නාමිකයන්ට දැන්වීම් සහිතව අලුත් ලේඛනයක් ඉදිරිපත් කිරීමට ඉල්ලුම්කළ හැකි ය. එවැනි අලුත් ලේඛනයක් ඉදිරිපත් කිරීමේ දී නම් කරන පාර්ශ්වයේ පැරණි ලේඛනය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකිය යුතු අතර, නව ලේඛනයේ අන්තර්ගත නම් කිරීම වහාම බලාත්මක විය යුතු ය.

(5) නම්කරන පාර්ශ්වකරුවකු මිය යාමෙන් පසුව ද නඩු නිමිත්ත පවතී නම්, මියගිය නම්කළ පාර්ශ්වකරුවකු ජීවත්ව සිටියේ නම්, ඔහුට ගැනීමට හිමිකම් තිබූ සියලු පියවර අවශ්‍ය පරිදි ගැනීමට මියගිය නම් කරන ලද පාර්ශ්වකරුගේ නීත්‍යනුකූල නියෝජිතයාට හිමිකම ඇත.

(6) (අ) මියගිය නම්කළ පාර්ශ්වකරුගේ නීත්‍යනුකූල නියෝජිතයා ලෙස ක්‍රියා කිරීමට නාමිකයකු ප්‍රතික්ෂේප නොකළ යුතු ය. ඔහු විසින් පෙත්සමක් මගින් අධිකරණයේ අවසරය පළමුවෙන් ලබාගෙන සහ තවත් නාමිකයන් ඇත්නම් ඔවුන්ට දැන්වීම් ලබා දීමෙන් පසුව එම නම්කළ පාර්ශ්වයේ නීත්‍යනුකූල නියෝජිත ධුරයෙන් මුදා හැරීම සඳහා අධිකරණයේ අවසර ලබා ගැනීමට ඉල්ලුම් කළ හැකි ය. නම්කළ පාර්ශ්වකරු මිය යාමේ දින සිට මාස දෙකකට වැඩි කාලයක් ගත වීමට පෙර එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) නීත්‍යනුකූල නියෝජිත ධුරයෙන් නිදහස් කිරීම සඳහා අධිකරණය විසින් අවසරය ලබා දෙන අවස්ථාවක නම්කළ පාර්ශ්වකරු විසින් ගොනු කරන ලද ලේඛනයේ ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව ඊළඟට නම ඇති නාමිකයා නඩුවේ කාර්ය සඳහා මියගිය නම්කළ පාර්ශ්වකරුගේ නීත්‍යනුකූල නියෝජිතයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) මේ වගන්තියේ (අ) ඡේදය යටතේ වූ ඉල්ලීමක් එකම නාමිකයා වන නාමිකයකු විසින් හෝ මියගිය නම්කළ පාර්ශ්වකරුගේ ඉතිරි එකම නාමිකයා විසින් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, එම නාමිකයා විසින් ඔහුගේ ඉල්ලීම පිළිබඳව මියගිය නම්කළ පාර්ශ්වකරුගේ උරුමක්කාරයන් වෙත දැනුම් දිය යුතු අතර, ඉහත කී පරිදි අධිකරණය විසින් අවසරය ප්‍රදානය කරනු ලැබුවහොත් මේ නඩුවේ කාර්ය සඳහා මියගිය නම්කළ පාර්ශ්වකරුගේ නීත්‍යනුකූල නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම සඳහා අධිකරණය විසින් මියගිය නම්කළ පාර්ශ්වකරුගේ උරුමක්කාරයකු පත් කරනු ලැබිය යුතු ය.

ලේඛනයක් ගොනු කිරීමට අපොහොසත් වීම.

394. (1) මේ වගන්තියේ විධිවිධාන යටතේ ලේඛනයක් ගොනු කිරීමට නම් කළ පාර්ශ්වකරුවකු අපොහොසත් වීම නොතකා සහ මියගිය පාර්ශ්වකරුගේ නියෝජිතයකු ලෙස කිසිම තැනැත්තකු පත්කර නොමැති වීම නොතකා, එම නඩුවේ දී ප්‍රකාශයට පත්කර ඇති යම් නඩු තීන්දුවක් හෝ තීන්දු ප්‍රකාශයක් නැතහොත් ආඥාවක් වලංගු සහ බලාත්මක ලෙස සලකනු ලැබිය යුතු අතර, සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව එම නඩු තීන්දුවෙන් හෝ තීන්දු ප්‍රකාශයෙන්, ආඥාවෙන් මිය ගිය පාර්ශ්වකරුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන් සහ නියෝජිතයන් බැඳී සිටිනු ලැබේ. ලේඛනයක් ගොනු කිරීමට අපොහොසත්වීම යම් නඩුවක නීති කෘත්‍යය නිර්බල කිරීම සඳහා හේතුවක් නොවන්නේ ය.

(2) (අ) ලේඛනයක් ගොනු කිරීම පැහැර හැර ඇති යම් නඩුවක පාර්ශ්වකරුවකු මියගිය විට එම නඩුවේ යම් පාර්ශ්වකරුවකු විසින් පෙත්සමක් සහ දිවුරුම් පෙත්සමක් මගින් අධිකරණය වෙත ඒකපාර්ශ්වික ඉල්ලීමක් ඉදිරිපත් කරමින්, එම නඩුවේ මියගිය පාර්ශ්වකරු වෙනුවට පොල්මඃකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ අද්මිනිස්ත්‍රාස් කිරීමේ වටිනාකමට වඩා අඩු වටිනාකමක් ඇති බූදලයක් සම්බන්ධයෙන් වනවිට මියගිය පාර්ශ්වකරුගේ උරුමය භාරගත් ළඟම නෑයා ආදේශ කරනු ලැබිය යුතු ය.

(ආ) අධිකරණය විසින් එම පත්වීම අවශ්‍ය බවට සහ අදාළ පාර්ශ්වය මියයාමෙන් පසුව ද නඩු නිමිත්ත පවතින බවට සෑහීමට පත්වීමෙන් පසු එම තැනැත්තා පත් කරනු ලැබිය හැකි ය.

(ඇ) එසේ පත් කරනු ලබන තැනැත්තා ඔහු පත්කිරීමට පෙර පැවති නීති කෘත්‍යවලින් බැඳී සිටිනු ලැබේ:

එසේ වුව ද, පත් කරනු ලැබ ආදේශක පාර්ශ්වයක් කර ඇති යම් තැනැත්තකු විසින් තමා පොල්මඃකරුගේ හෝ අද්මිනිස්ත්‍රාස්කරු හෝ

අද්මිනිස්ත්‍රාසි වටිනාකමට වඩා අඩු වටිනාකමක් ඇති බූදලයක් සම්බන්ධයෙන් වනවිට මියගිය පාර්ශ්වකරුගේ උරුමය භාරගත් ළඟම නෑයා නොවන බව ප්‍රකාශ කරමින් විරුද්ධත්වය පළ කළ හැකි අතර, නියෝජිතයකු වශයෙන් උචිත විත්ති වාචක ඉදිරිපත් කළ හැකි ය.

නීත්‍යනුකූල නියෝජිතයා ඉවත් කිරීම සඳහා වූ ඉල්ලීම.

395. (1) (අ) මියගිය නම්කළ තැනැත්තාගේ නීත්‍යනුකූල නියෝජිතයා ඉවත් කිරීම සඳහා සහ එම ඉල්ලීමේ නම්කර ඇති තැනැත්තා පත්කිරීම සඳහා හෝ මියගිය නම්කළ තැනැත්තා විසින් ගොනු කරන ලද ලේඛනයේ නීත්‍යනුකූල නියෝජිතයා ලෙස ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව නම් කරන ලද ඊළඟ තැනැත්තා පත්කිරීම සඳහා පොල්මඃකාරයකු හෝ අද්මිනිස්ත්‍රාසිකරු හෝ අද්මිනිස්ත්‍රාසි වටිනාකමට වඩා අඩු වටිනාකමක් ඇති බූදලයක් සම්බන්ධයෙන් වනවිට මියගිය පාර්ශ්වකරුගේ උරුමය භාරගත් ළඟම නෑයා විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය. තත්කාලයේ මියගිය නාමිකයාගේ නීත්‍යනුකූල නියෝජිතයා වන තැනැත්තා එම ඉල්ලීමේ වගඋත්තරකරුවකු කළ යුතු ය.

(ආ) පොල්මඃකරුවකුගේ හෝ අද්මිනිස්ත්‍රාසිකරු හෝ අද්මිනිස්ත්‍රාසි වටිනාකමට වඩා අඩු වටිනාකමක් ඇති බූදලයක් සම්බන්ධයෙන් වනවිට, මියගිය පාර්ශ්වකරුගේ උරුමය භාරගත් ළඟම නෑයාගේ යහපත සඳහා වන බවට අධිකරණය විසින් එම නීත්‍යනුකූල නියෝජිතයා ඉවත්කර මියගිය නම්කළ පාර්ශ්වකරු විසින් ගොනු කරන ලද ලේඛනයේ ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව නම්කර ඇති තැනැත්තා පත් කරනු ලැබිය යුතු ය. තව ද, එසේ කිරීමට ප්‍රමාණවත් හේතු ඇත්නම්, මියගිය නම්කළ පාර්ශ්වකරුගේ නීත්‍යනුකූල නියෝජිතයා ලෙස ඉල්ලීමේ නම් කර ඇති තැනැත්තා පත් කරනු ලැබිය යුතු ය.

(ඇ) මේ උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක්, පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කළ යුතු අතර, අධිකරණය විසින් මියගිය නම්කළ

තැනැත්තාගේ වෙනත් උරුමක්කාරයන් ඇත්නම්, ඉල්ලීම පිළිබඳව එම උරුමක්කාරයන්ට දැන්වීම් නිකුත් කළ යුතු ය.

(2) මේ වගන්තිය යටතේ ලේඛනයක් ගොනු කිරීමට නියමිත නම්කළ පාර්ශ්වකරුවකු මියයාම නිසා කිසිදු නඩු කටයුත්තක් කල්තැබීම, අඩාලව කල්තැබීම, නඩුවේ යම් පියවරක් කල්තැබීම නොකළ හැකි ය.

(4) මේ පරිච්ඡේදයේ කාර්යය සඳහා-

"බූදලය" යන්නෙන්, මියගිය තැනැත්තා සතුව ඔහු මිය යන අවස්ථාවේ දී පැවති සියලු වත්කම් සහ බැරකම් අදහස් වේ;

"නීත්‍යානුකූල නියෝජිතයා" යන්නෙන්, මියගිය පාර්ශ්වකරුවකුගේ බූදලය නියෝජනය කරන තැනැත්තා හෝ මේ නඩුවේ කාර්ය සඳහා (1) වන උපවගන්තිය යටතේ ගොනු කරන ලද ලේඛනයක නම්කර ඇති තැනැත්තා අදහස් වේ.

නඩුව ඉදිරියට ගෙන යා යුතු බවට අධිකරණය විසින් නියෝග කළ යුතු බව.

396. පැමිණිලිකරුවන් හෝ විත්තිකරුවන් එක් අයකුට වැඩි සංඛ්‍යාවක් සිට ඔවුන්ගෙන් යම් කෙනකු මිය ගොස් නඩු නිමිත්ත මත නඩු පැවරීමේ අයිතිවාසිකම හුදෙක් උත්තරජීවී පැමිණිලිකරු හෝ උත්තරජීවී විත්තිකරුට විරුද්ධව පවතී නම්, දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරන ලද පෙත්සමක් මගින් වූ ඒකපාර්ශ්වික ඉල්ලීමක් මත අධිකරණය විසින් අවස්ථාවෝචිත පරිදි උත්තරජීවී පැමිණිලිකරුගේ හෝ පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම පිට හෝ උත්තරජීවී විත්තිකරුට හෝ විත්තිකරුවන්ට විරුද්ධව නඩුව ඉදිරියට ගෙන යා යුතු බවට නියෝගයක් කළ යුතු ය.

නීත්‍යානුකූල නියෝජිතයා ආදේශ කළ පැමිණිලිකරු කළ හැකි බව.

397. පැමිණිලිකරුවන් එක් අයකුට වැඩි සංඛ්‍යාවක් සිට ඔවුන්ගෙන් යම් කෙනෙකු මිය ගොස් නඩු පැවරීමේ අයිතිවාසිකම් හුදෙක් උත්තරජීවී පැමිණිලිකරු හෝ පැමිණිලිකරුවන් කෙරෙහි පමණක් නොපැවැත ඔවුන් සහ මියගිය

පැමිණිලිකරුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන් කෙරෙහි එක්ව පවතී නම්, මියගිය පැමිණිලිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා ද මියගිය පැමිණිලිකරු වෙනුවට ආදේශ කළ යුතු බවට අධිකරණය විසින් කටයුතු සැලැස්විය හැකි අතර, ඉන්පසු වාර්තාවෙහි ඒ බවට සටහනක් කරවා නඩුව ඉදිරියට ගෙන යා යුතු ය.

නීත්‍යානුකූල නියෝජිතයා විසින් තමාගේ නම වාර්තාවේ ඇතුළත් කරවා ගැනීමට ඉල්ලුම් කළ හැකි බව.

398. එකම පැමිණිලිකරු හෝ එකම උත්තරජීවි පැමිණිලිකරු මියගිය අවස්ථාවක, නඩු පැවරීමේ අයිතිවාසිකම තවදුරටත් පවතී නම්, මියගිය තැනැත්තාගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් මිය ගිය පැමිණිලිකරුගේ නම වෙනුවට තමාගේ නම වාර්තාවේ ඇතුළත් කරවා ගැනීම පිණිස අධිකරණය වෙත ඉල්ලුම් කළ හැකි ය. අධිකරණය විසින් වාර්තාවෙහි ඒ බව සටහන් කිරීමට කටයුතු සැලැස්විය යුතු අතර, ඉන්පසු නඩුව සම්බන්ධ කටයුතු කරගෙන යා යුතු ය.

මිය ගිය පැමිණිලිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් ඉල්ලීම නොකළ අවස්ථාවක දී.

398අ. මියගිය පැමිණිලිකරුවකු මියයාමේ දින සිට මාස හයක් ඇතුළත එකී මියගිය පැමිණිලිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් කිසිම ඉල්ලීමක් අධිකරණය වෙත ඉදිරිපත් නොකරනු ලැබුවහොත්, නඩුව නතර විය යුතු බවට අධිකරණය විසින් නියෝගයක් කොට මියගිය පැමිණිලිකරුගේ බූදලයෙන් අය කර ගැනීමට හැකි වන සේ විත්තිකරු විසින් නඩුවේ විත්තිවාචක ඉදිරිපත් කිරීමේ දී දරන ලද ගාස්තු විත්තිකරු වෙත ප්‍රදානය කළ හැකි ය. කෙසේ වුව ද, සුදුසු යයි අධිකරණය කල්පනා කරන්නේ නම්, විත්තිකරුගේ ඉල්ලීම පිට හා ගාස්තු සම්බන්ධයෙන් හෝ වෙන යමක් සම්බන්ධයෙන් හෝ සුදුසු යයි අධිකරණය කල්පනා කරන නියමයන් මත, විවාදාත්මක කාරණය අවසාන වශයෙන් තීරණය කිරීම පිණිස නඩුව ඉදිරියට ගෙනයාම සඳහා මියගිය පැමිණිලිකරු වෙනුවට මියගිය පැමිණිලිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා පත් කරමින් අධිකරණය විසින් නියෝගයක් කළ හැකි ය.

මිය ගිය විත්තිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා, විත්තිකරු කිරීමට ඉල්ලීම.

398ආ. (1) විත්තිකරුවන් එක් අයකුට වඩා වැඩි ගණනක් සිට තීන්දු ප්‍රකාශයට පෙර ඔවුන්ගෙන් යම් කෙනෙකු මියගොස් මියගිය විත්තිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා ආදේශ නොකර උත්තරජීවී විත්තිකරුට හෝ විත්තිකරුවන්ට පමණක් විරුද්ධව ඒ නඩු නිමිත්ත පිට නඩු පැවරීමේ අයිතිවාසිකම අතිරික්තව නොපවතින විට ද එකම විත්තිකරු හෝ එකම උත්තරජීවී විත්තිකරු මියගොස් නඩු පැවරීමේ අයිතිවාසිකම පැමිණිලිකරු කෙරෙහි අතිරික්තව පවතින විට, නඩුව දිගටම පවත්වාගෙන යාමේ කාර්ය සඳහා මියගිය විත්තිකරු වෙනුවට මියගිය විත්තිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා පත් කරන ලෙස පැමිණිලිකරු විසින් අධිකරණයට ඉල්ලුම් කළ හැකි ය. ඉන්පසු මියගිය විත්තිකරු වෙනුවට එම නීත්‍යානුකූල නියෝජිතයාගේ නම වාර්තාවට ඇතුළත් කිරීමට අධිකරණය විසින් සැලැස්විය යුතු අතර, එම නීත්‍යානුකූල නියෝජිතයා වෙත දැන්වීම් නිකුත් කරමින් නඩුවට විත්තිවාචක ඉදිරිපත් කිරීම සඳහා එම දැන්වීමේ සඳහන් දිනයක දී අධිකරණයේ පෙනී සිටින ලෙස එම නීත්‍යානුකූල නියෝජිතයාට නියම කළ හැකි ය.

(2) මියගිය විත්තිකරුගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් මිය ගිය විත්තිකරු වෙනුවට තමා විත්තිකරු කරවා ගැනීම පිණිස ඉල්ලුම් කළ හැකි ය. අදාළ වනතාක් දුරට මේ වගන්තියේ විධිවිධාන ඒ ඉල්ලීමට ද නඩු කටයුතුවලට ද ඉන් පැන නගින ප්‍රතිඵලවලට ද අදාළ විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 405 වගන්තිය ඉවත් කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 405 වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 440ආ සහ 440ඇ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 440අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 440ආ සහ 440ඇ යන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

**"යම් රජයේ කාර්යාලයක්, සංස්ථා ආදිය විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනවල පිටපත් ලබා ගැනීම.**

440ආ. (1) යම් රජයේ කාර්යාලයක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සාමාන්‍ය කටයුතු අතරතුර දී තැන්පත් කර ඇති හෝ පවත්වාගෙන යනු ලබන හෝ භාරයේ තබා ඇති යම් ලේඛනයක හෝ රෙජිස්ටරයක පිටපතක් (හෝ යම් රෙජිස්ටරයක හෝ පොතක සහතික පිටපතක්) සිවිල් අධිකරණයක යම් නඩු කටයුත්තක පාර්ශ්වකරුවකුට ඒ නඩු කටයුත්තේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, එම නඩු කටයුතු සඳහා එම සහතික පිටපත අදාළ වන බවට ස්ථිර කරමින් එම පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරන ලද මෝසමක් මගින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත එම සහතික පිටපත නිකුත් කරන ලෙස පූර්ව නඩු විභාග විනිශ්චයකාරවරයා විසින් හෝ අධිකරණය විසින් අවස්ථාවෝචිත පරිදි එම රජයේ කාර්යාලයේ, රාජ්‍ය සංස්ථාවේ යම් නීතියක් හෝ ප්‍රඥප්තියක් මගින් පිහිටුවන ලද ආයතනයේ, පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ ස්ථානභාර නිලධරයාට විධාන කළ හැකි ය.අධිකරණයේ හෝ පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයාගේ විධානය ඉදිරිපත් කිරීමෙන් පසු අදාළ ගාස්තුව ගෙවීමෙන් පසු අදාළ ලේඛනයෙහි සහතික පිටපතක් ලබා ගැනීමට එකී පාර්ශ්වකරුට හිමිකම ඇත්තේ ය.

(2) යම් නඩු කටයුත්තක පාර්ශ්වකරුවකු විසින් ඉහත (1) උපවගන්තිය යටතේ රජයේ කාර්යාලයකින්, රාජ්‍ය සංස්ථාවකින්, යම් නීතියක් හෝ ප්‍රඥප්තියක් යටතේ පිහිටුවන ලද ආයතනයකින්, පළාත් සභාවකින් හෝ පළාත් පාලන ආයතනයකින් එම නඩු කටයුත්තට අදාළව ලබාගත් සහතික පිටපතක් එම රජයේ කාර්යාලයේ, රාජ්‍ය සංස්ථාවේ, නීතියක් හෝ ප්‍රඥප්තියක් මගින් පිහිටුවන ලද ආයතනයේ, පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ නිලධරයකු සාක්ෂිකරුවකු ලෙස කැඳවනු නොලැබ එම ලේඛනය සාදනු ලැබුවේ හෝ එම ලේඛනය භාරව ඇත්තේ එම රජයේ කාර්යාලය, රාජ්‍ය සංස්ථාව නීතියක් හෝ ප්‍රඥප්තියක් මගින් පිහිටුවන

ලද ආයතනය, පළාත් සභාව හෝ පළාත් පාලන ආයතනය විසින් බවට ඔප්පු කිරීමේ සාක්ෂි වශයෙන් එම පාර්ශ්වකරු විසින් එම නඩු කටයුතුවලදී ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එම සහතික පිටපත එකී අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට සාක්ෂියක් විය යුතු ය:

එසේ වුව ද, අධිකරණය විසින් සිය මෙහෙයවීමෙන්ම හෝ එම නඩු කටයුතුවල යම් පාර්ශ්වකරුගේ ඉල්ලීම පිට, මුල් ලේඛනය ඉදිරිපත් කරන ලෙස නියම කර එය පරීක්ෂා කිරීමට එම පාර්ශ්වකරුට අවසර දිය හැකි අතර නැතහොත් එම ලේඛනය භාරව සිටින හෝ පවත්වාගෙන යන නිලධරයා සාක්ෂිකරුවකු ලෙස කැඳවන ලෙස නියම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

යම් ලේඛනයක් අභියෝගයට ලක් කරනු ලැබ ඇත්නම් මිස, එය ඔප්පු කිරීම අනවශ්‍ය බව.

440ඇ. (1) මේ සංග්‍රහයේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, රජයේ කාර්යාලයකින්, රාජ්‍ය සංස්ථාවකින්, නීතිය මගින් හෝ ප්‍රඥප්තියක් මගින් පිහිටුවන ලද ආයතනයක් විසින්, පළාත් සභාවක් විසින්, පළාත් පාලන ආයතනයක් විසින් නිකුත් කරන ලද බැලූ බැල්මට පෙනෙන පරිදි වූ මුල් ලේඛනයක් හෝ සහතික පිටපතක්, වාර්තාගත කළ යුතු හේතු අනුව විරුද්ධ පාර්ශ්වයක් විසින් අභියෝගයට ලක් කරනු ලැබ, එම හේතු අනුව අධිකරණය විසින් ඔප්පු කරන ලෙස නියම කරනු ලබන්නේ නම් මිස එම මුල් ලේඛනය හෝ සහතික පිටපත පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(2) යම් ලේඛනයක අව්‍යාජභාවය යම් පාර්ශ්වයක් විසින් අභියෝගයට භාජනය කරනු ලබන අවස්ථාවක, එසේ අව්‍යාජභාවය අභියෝගයට ලක් කිරීම සඳහා වූ හේතු එම පාර්ශ්වය විසින් සඳහන් කළ යුතු අතර, අධිකරණය විසින් එම හේතු වාර්තාගත කළ යුතු ය.

(3) ලේඛනය ඔප්පු කිරීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු අධිකරණය විසින් එම ලේඛනය පිළිගනු ලැබුවහොත් අධිකරණය විසින් යහපත් හේතු අනුව

අන්‍යාකාරයකට විධාන කරන්නේ නම් මිස, ලේඛනය අභියෝගයට ලක් කළ පාර්ශ්වය බදු අයකර ගාස්තු ගෙවීමට අමතරව ලේඛනය ඔප්පු කිරීමේ දී දරන ලද වියදම් ගෙවීමටත් දායක වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 774 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 774 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(3) අභියාචන අධිකරණයක් විසින් මේ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරනු ලබන යම් නඩු තීන්දුවක්, නියෝගයක් හෝ විධානයක් සම්බන්ධයෙන් අභියාචනය යොමුකර ඇත්තේ යම් අධිකරණයක සිට ද එම මුල් අධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දුවක්, නියෝගයක් හෝ විධානයක් ලෙස සලකනු ලැබිය යුතු ය.".

විභාගවෙමින් පවත්නා නඩු මේ පනතට යටත් වන බව.

**18.** දිසා අධිකරණයේ පවරා ඇති එහෙත් නඩු විභාගය සඳහා දිනයක් නියම කර නොමැති නඩු සහ මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට මේ පනතේ විධිවිධානවලට යටත් විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපලේඛනයේ අංක 7 දරන ආකෘති පත්‍රයට ඉක්බිතිව ම පහත දැක්වෙන ආකෘති පත්‍රය ඇතුළත් කරනු ලබන අතර එම ආකෘති පත්‍රය, එම පනතේ 7අ ආකෘති පත්‍රය ලෙස බලාත්මක විය යුතු ය:-

"7අ ආකෘති පත්‍රය

(27 හා 393 වන වගන්ති)

නෛතික නියෝජිතයකු නම් කරන ලේඛනයේ ආකෘති පත්‍රය

………………………..……. දිසා අධිකරණයේ දී ය.

නඩු අංකය ………………

මේ නඩුව අවසාන වශයෙන් අසා තීරණය කිරීමට පෙර මගේ මරණය සිදු වුවහොත් මේ නඩුවේ කාර්ය සඳහා මේ නඩුවේ (පැමිණිලිකරු/ විත්තිකරු/ පෙත්සම්කරු/ වගඋත්තරකරු/ එක්කිරීමට/ ආදේශ කිරීමට ඉල්ලා සිටින

පාර්ශ්වය) වන මම………………………………… මේ නඩුවේ නීත්‍යානුකූල නියෝජිතයා ලෙස පහත දැක්වෙන තැනැත්තන් මෙයින් නම් කරමි.

ප්‍රමුඛතා අංක 1 …………………………………………හි පදිංචි (ලිපිනය) ………………………………………………………………(නම)

ප්‍රමුඛතා අංක 2 ………………………………………… හි පදිංචි (ලිපිනය) ………………………………………………………………(නම)

ප්‍රමුඛතා අංක 3 ………………………………………… හි පදිංචි (ලිපිනය) ………………………………………………………………(නම)

ඉහත කී පරිදි මගේ මරණය සිදු වුවහොත් මේ නඩුවේ කාර්ය සඳහා මගේ නීත්‍යානුකූල නියෝජිතයා වශයෙන් ඔවුන් දක්වා ඇති ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව ඔවුන් පත් කරන ලෙස මා මෙයින් තවදුරටත් ඉල්ලා සිටිමි.

………………………………………………………………………… හි පදිංචි ……………………………………………………… වන මම ඉහත කී පත් කිරීමට කැමැත්ත පළ කරමි.

……………………
අත්සන

1. ………………………………………………………………… හි පදිංචි ……………………………………………………………… වන මම ඉහත කී පත් කිරීමට කැමැත්ත පළ කරමි.

2. ………………………………………………………………… හි පදිංචි ……………………………………………………… වන මම ඉහත කී පත් කිරීමට කැමැත්ත පළ කරමි.

ඉහත නම් සඳහන් තැනැත්තා මෙම ලේඛනයේ අන්තර්ගත කරුණු කියවා තේරුම්ගත් බවටත්/ ඉහත නම් සඳහන් තැනැත්තාට මේ ලේඛනයේ සඳහන් කරුණු මා විසින් කියවා තේරුම් කර දුන් බවටත් ඔහු 20… ………………..මස……………… දින දී මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවටත් නීතිඥවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු වන ………………………………………… හි පදිංචි ……………………… වන මම මෙයින් සහතික කරමි.

……………………
අත්සන

නීතිඥ/ සාමදාන විනිශ්චයකාර/ දිවුරුම් කොමසාරිස්

……………………
අත්සන

3. ................................ පදිංචි .................................... වන මම ඉහත කී පත් කිරීමට කැමැත්ත පළ කරමි.

........................
අත්සන

ඉහත නම් සඳහන් තැනැත්තා මෙම ලේඛනයේ අන්තර්ගත කරුණු කියවා තේරුම්ගත් බවටත්/ ඉහත නම් සඳහන් තැනැත්තාට මේ ලේඛනයේ සඳහන් කරුණු මා විසින් කියවා තේරුම් කර දුන් බවටත් ඔහු 20... ...................මස.................. දින දී මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවටත් නීතිඥවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු වන ............................................... හි පදිංචි ............................ වන මම මෙයින් සහතික කරමි.

........................
අත්සන

නීතිඥ/ සාමදාන විනිශ්චයකාර/ දිවුරුම් කොමසාරිස්

........................
අත්සන

(පැමිණිලිකරු/ විත්තිකරු/ පාර්ශ්වකරු/ හිමිකම්පාන්නා/ අවශ්‍ය පාර්ශ්වය/ එකතු කළ/ ආදේශ කළ පාර්ශ්වය)

........................
අත්සන

ඉහත නම් සඳහන් තැනැත්තා මෙම ලේඛනයේ අන්තර්ගත කරුණු කියවා තේරුම්ගත් බවටත්/ ඉහත නම් සඳහන් තැනැත්තාට මේ ලේඛනයේ සඳහන් කරුණු මා විසින් කියවා තේරුම් කර දුන් බවටත් ඔහු 20... ...................මස.................. දින දී මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවටත් නීතිඥවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු වන ............................................... හි පදිංචි ............................ වන මම මෙයින් සහතික කරමි.

........................
අත්සන

නීතිඥ/ සාමදාන විනිශ්චයකාර/ දිවුරුම් කොමසාරිස්.".

(2) එහි සඳහන් (අංක 41 දරන) තීන්දු ප්‍රකාශයේ ආකෘති පත්‍රය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ආකෘති පත්‍රය ආදේශ කරන්න:-

“තීන්දු ප්‍රකාශයේ ආකෘති පත්‍රය

(188 වන වගන්තිය)

| | |
|---|---|
| අධිකරණය | |
| නඩුවේ අංකය | |
| පැමිණිලිකරු (වන්) | |
| විත්තිකරු (වන්) | |
| නඩු තීන්දුවේ දිනය | |
| මෙම තීන්දු ප්‍රකාශය මගින් ප්‍රදානය කරන ලද ණය/ වන්දි ප්‍රමාණය/ පොලිය හෝ වෙනත් සහන (මෙම තීන්දු ප්‍රකාශය මගින් සහන ප්‍රදානය කර ඇත්තේ කවර පාර්ශ්වයක වාසියකට ද නැතහොත් කවර පාර්ශ්වයකට එරෙහිව ද යන වග (පාර්ශ්වකරුවන්ගේ නම් සඳහන් කරන්න) | |
| ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය රු. ............................<br>බදු ගෙවිය යුතු ගාස්තු | |

| | |
|---|---|
| දේපළ විස්තරය (එවැන්නක් ඇත්නම්) (එම විස්තරය යම් උත්තරවාදවලට ඇති විස්තරයකට අනුව හෝ නඩු වාර්තාවට ගොනු කර ඇති ලේඛනයක දැක්වෙන විස්තර අනුව විය හැකි ය.) | |
| විනිශ්චයකාරවරයාගේ අත්සන | |
| මුද්‍රාව | |

”.

**20.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.